යම් ජන කොටසක ආකල්ප සහ චින්තනය හැඩගැස්වීම කෙරෙහි ඔවුන් භාවිතා කරනා භාෂාව අතිශයින්ම වැදගත් වේ. ශිෂ්ට සම්පන්න භාෂාවක් භාවිතා කිරීම ඔස්සේ වඩාත් ශිෂ්ට සම්පන්න චින්තනයක් දියුණු වනු ඇත. අප කාලයක් පුරාවට භාවිතා කරනා යම් යම් යෙදුම් හා බැඳි ගර්හාත්මක, කොන් කිරීමේ ආකල්ප තිබේ නම්, එම යෙදුම් පවා වර්තමානයට සරිලන ලෙසින් වෙනස් කර ගැනීම එම ශිෂ්ටසම්පන්න චින්තනය වෙත තබන පියවරක් වනු ඇත.

ඊට උදාහරණ ලෙස "කෙලෙසීම" වැනි යෙදුම් ගත හැක. දූෂණය හෝ කෙළෙසීම වැනි යෙදුම් තුළ ගම්‍ය වන්නේ ඊට අදාළ වින්දිතයා අපවිත්‍ර වී ඇති බවක්, කිලිටි වී ඇති බවක් වේ. එසේම ඒ හා බැඳි ගර්හාත්මක සමාජ ආකල්පය ඔස්සේද වින්දිතයාව කොන් කිරීමකට ලක් විය හැක. එම නිසා කෙළෙසීම වැනි යෙදුම් වෙනුවට ලිංගික අපරාධය හෝ බාලවයස්කරුවෙකු සම්බන්ධයෙන් නම් ළමා ලිංගික අපයෝජනය වැනි යෙදුම් භාවිතය වඩාත් යෝග්‍ය වනු ඇත.

#MediaEthicsSL #lka #SinhalaPress #Mawbima